**බුත්තල ප්‍රාදේශීය සභාව.**

**<u>බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම - 2025</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාරව, බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ (1) වන තීරුවේ නිරූපිත යම් කාර්යක් 2025 වර්ෂයේදී දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම 11 වන තීරුවේ නිරූපිත යම් සීමාවන් ඇතුළත් වන යම් අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බව 2024.09.26 දින පැවැති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වැනි දින,
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදී ය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශීය සභාව.

උප ලේඛන අංක 1

1 වන තීරුව 11 වන තීරුව

| අනු අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750 ට නොවැඩි රු. ශත | වාර්ෂික වටිනාකම රු.751 සිට1500 දක්වා රු.. ශත | වාර්ෂික වටිනාකම රු.1,501 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 01 | ගල් කොරියක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | කලු ගල් ඇඹරීම,යන්ත්‍රානුසාරයෙන් ගල් මෝලක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | කලු ගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | ඩොලමයිට් හා හුණු ගල් කැඩීම පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | ගෑස් සිලින්ඩර් ගබඩා කර විකිණීම. | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | ටින්කර් හා ස්ප්‍රේ පේන්ටින් කිරිම. | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | වායු සමීකරණ අලුත් වැඩියා කිරිම. | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | පයිබර් ග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1,000.00 |

**බලය දෙනු ලබන කාර්යය**

| | | | | |
|---|---|---|---|---|
| 1. | බත් කඩයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 2. | තේ කඩයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 3. | බේකරියක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 4. | භෝජන ශාලාවක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 5. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 6. | සිල්ලර බඩු කඩයක් පවත්වා ගෙන යාම.<br>(පොල්තෙල් සහ භූමිතෙල් රහිතව) | 500.00 | 750.00 | 1000.00 |
| 7. | තොග සහ සිල්ලර බඩු කඩයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 8. | ශීත කළ ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 9. | ශීත කළ මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම<br>01.කුකුල් මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | මිරිදිය මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11. | කරදිය මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 12. | එළවළු කඩයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 13. | පළතුරු කඩයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 14. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 15. | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 16. | යාන්ත්‍රික නොවන වඩුමඩුවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 17. | යාන්ත්‍රික වඩු කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 18. | කම්මලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | වී මෝලක් පවත්වාගෙන යාම.<br>1.අ.බ.1-10 දක්වා<br>2. අ.බ.10 වැඩි | 500.00<br>500.00<br>500.00 | 750.00<br>750.00<br>750.00 | 1000.00<br>1000.00<br>1000.00 |
| 20. | ලී මෝලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 21. | ධාන්‍ය හා කුළු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 22. | හුණු තොග වශයෙන් ගබඩා කර විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 23. | මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 24. | මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 25. | පොහොර ගබඩා කර තබා ගැනීමේ සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 26. | කෘෂි රසායනික ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 27. | යකඩ ග්‍රීල් ගේට්ටු වැටවල් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 28. | කොප්පරා වේලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 29. | සත්ව ආහාර හා ගොවිපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 30. | බීඩි, සුරුට්ටු නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 31. | සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 32. | පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 33. | කුළු බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 34. | කිරි ආහාර අයිස්ක්‍රීම් හා යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 35. | ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 36. | යතුරුපැදි, ත්‍රිරෝද රථ , හා පා පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 37. | මිනී පෙට්ටි සෑදීම ,ගබඩා කිරීම හෝ මල්ශාලාවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 38. | ආයුර්වේද ඖෂධ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 39. | ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 40. | සිසිල් බීම හා පළතුරු බීම නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම සඳහා. | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 41. | පළතුරු බීම අලෙවි සැලක් පවත්වාගෙන යාම සඳහා . | 500.00 | 750.00 | 1000.00 |
| 42. | හිස් බෝතල් ,හිස් ගෝනි, පරණ පත්තර එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා. | 500.00 | 750.00 | 1000.00 |
| 43. | දුම්කොළ සකස් කිරීමේ හා වියළීමේ ස්ථානයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 44. | හෝටලයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 45. | චීන අවන්හලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 46. | විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 47. | අත් යන්ත්‍ර මඟින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම. | 500.00 | 500.00 | 1000.00 |
| 48. | ක්‍රීඩා සමාජයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 49. | කෘෂිකාර්මික ගොවිපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 50. | කොහුවලක් සහ මෝලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 51. | බයිට් නිෂ්පාදන හා රස කැවිලි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 52. | සමූපකාර සිල්ලර වෙළඳසැලක්(ප්‍රාදේශිකයක්)සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 53. | ග්‍රොසරි සහ බෙහෙත් ශාලාවක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 54. | කුළු බඩු නිෂ්පාදනය හා අලෙවි කිරිම. | 500.00 | 750.00 | 1000.00 |
| 55. | අයිස්ක්‍රීම් නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 56. | බිම්මල් වගාවක් පවත්වා ගෙනයාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 57. | තේ කොළ පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 58. | සිසිල් බීම වෙළඳසැලක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 59. | හකුරු නිෂ්පාදනය කිරිමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 60. | ස්වර්ණාභරණ අලුත්වැඩියා කිරිමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 61. | පානිය ජලය බෝතල් කර විකිණිම. | 500.00 | 750.00 | 1000.00 |
| 62. | ජලය පිරිපහදු කර අලෙවි කිරිම. | 500.00 | 750.00 | 1000.00 |

## පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර

| | | | | |
|---|---|---|---|---|
| 1. | රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු කරදමුංගු එනසාල් හෝ කෙඳි කිරිම. | 500.00 | 750.00 | 1000.00 |
| 2. | ඩ්‍රයික්ලින් කිරිම හෝ සායම් දැමිම. | 500.00 | 750.00 | 1000.00 |
| 3. | රෙදි මුද්‍රණය කිරිම. | 500.00 | 750.00 | 1000.00 |
| 4. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරිමේ ස්ථානයක් පැවැත්විම. | 500.00 | 750.00 | 1000.00 |
| 5. | හුණුගල් හෝ හිරිගල් පිලිස්සිම, සකස් කිරිම හෝ අලුහුණු ගබඩා කිරිම. | 500.00 | 750.00 | 1000.00 |
| 6. | බැටරි විද්‍යුත් ආරෝපන කිරිම හෝ අලුත්වැඩියා කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 7. | මෝටර් වාහන අලුත්වැඩියා කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 8. | මෝටර් වාහන සේවා කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 9. | වාත්තු මඩුවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 10. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ආයුර්වේද ඖෂධ, දේශිය ඖෂධ නිෂ්පාදනය කිරිම හෝ සංයෝජනය කිරිම. | 500.00 | 750.00 | 1000.00 |
| 12. | විදුරු භාණ්ඩ හෝ විදුරු තහඩු ගබඩා කිරිම. | 500.00 | 750.00 | 1000.00 |
| 13. | ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්විම. | 500.00 | 750.00 | 1000.00 |
| 14. | තේ කුඩුකර ගබඩාකර තබාගැනිම. | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 15. | වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 16. | ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 17. | පෙට්‍රල්, ඩිසල් තෙල් හා වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානක් පැවැත්වීම (ඛණිජ තෙල් සංස්ථාවේ අවසරයලත්) | 500.00 | 750.00 | 1000.00 |
| 18. | කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරිම. | 500.00 | 750.00 | 1000.00 |
| 19. | විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරිමේ වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 20. | කිරි ශිත කිරිම හා කිරි එකතු කිරිමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 21. | සිමෙන්ති බිලොක් ගල් නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 22. | රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 23. | කාබනික පොහොර නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 24. | ආහාර විජලනය කිරිම හා නිෂ්පාදනය අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

**බුත්තල ප්‍රාදේශීය සභාව**

**<u>1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වගන්ති ප්‍රකාරව බදු ගාස්තු අය කිරිම.</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව, බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025.01.01 දින සිට පනවා අයකළ යුතු යැයි 2024.09.26 දින පැවැති බුත්තල ප්‍රාදේශිය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වැනි දින,
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

**<u>කර්මාන්ත බදු</u>**

1 වන තීරුව 11 වන තීරුව

| අනු අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750 ට නොවැඩි රු. ශත | වාර්ෂිකව ටිනාකම රු.751 සිට1500 දක්වා රු. ශත | වාර්ෂිකව ටිනාකම රු.1,501 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 1. | ඇඳුම් මැසීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 2. | පින්තූර රාමු කිරිමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 3. | ඔරලෝසු අලුත් වැඩියා කිරිමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 500.00 | 1000.00 |
| 4. | බිඩි සුරුට්ටු විකිණීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 5. | හඳුන්කූරු නිෂ්පාදනය කිරිමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 6. | කොහු හෝ කෙඳිවලින් භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 7. | විදුලි උපකරණ නව නිපයුම් (LED බල්බ) | 500.00 | 750.00 | 1000.00 |
| 8. | වියළි කෝෂ,බැටරි නිපදවීමේ කර්මාන්තයක් සඳහා. | 500.00 | 750.00 | 1000.00 |
| 9. | තලාතු මිනිරන් වෙලිමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 10. | බීරළු කපන කර්මාන්තයක් පවත්වගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11. | දුම්කොළ ගබඩා කිරිමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 12. | රබර් දුම් ගැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම. | 500.00 | 500.00 | 1000.00 |
| 13. | රබර් මුද්‍රා කැපිමේ කර්මාන්තයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 14. | රබර් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | කොන්ක්‍රිට් හා මැටි පයිප්ප හෝ භාණ්ඩ නිෂ්පාදනය කර ගබඩා කර තැබිම. | 500.00 | 750.00 | 1000.00 |
| 16. | මැණික් ගල් කැපිම/ ඔප දැමිම කර්මාන්තයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 17. | ලොරි බොඩි සැදිමේ කර්මාන්තයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 18. | කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 19. | පැළ තවානක් පවත්වාගෙන යාමේ කර්මාන්තයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 20. | පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 21. | පාවහන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 22. | ජංගම දුරකතන අලුත් වැඩියාව. | 500.00 | 750.00 | 1000.00 |
| 23. | මැටි ගඩොල් නිෂ්පාදනය හා අලෙවි කිරිමේ නිෂ්පාදනයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |

**බුත්තල ප්‍රාදේශිය සභාව**

**<u>2025 වසර සඳහා වාර්ෂික ව්‍යාපාර බද්ද</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 152 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ ප්‍රාදේශිය සභාව වෙත පැවැරි ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2025 වර්ෂයේ පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උප ලේඛනයෙහි (1) වන තීරුවේ නිරුපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී උපලේඛනයේ දෙවන තීරුවේ අනුරූප සටහනේ නිරුපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු යැයි 2024.09.26 දින පැවැති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26වැනි දින,
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

උප ලේඛනය 1

| 1 වන තීරුව<br>2024 වර්ෂයේ ආදායම | 11 වන තීරුව<br>රු. ශත |
|---|---|
| 01. රු 6,000.00 නොඉක්මන අවස්ථා | කිසිවක් නැත |
| 02. රු 6,001 සිට 12,000 දක්වා | 90.00 |
| 03. රු 12,001 සිට 18,750 නොඉක්මන විට | 180.00 |
| 04. 18,751 සිට 75,000 නොඉක්මන විට | 360.00 |
| 05. රු 75,001 සිට 1,50,000 නොඉක්මන විට | 1,200.00 |
| 06. රු ,150,001 සිට ඉහළට | 3,000.0 |

උප ලේඛනය 11

<u>ව්‍යාපාර බදු</u>

01.කොන්ත්‍රාත්කරුවන්

02.මුදල් ණයට දෙන්නන්.(රජයේ හා පෞද්ගලික)

03.මුදල් ආයෝජකයින්.(බැංකු)

04.වෙන්දේසිකරුවන් හා තැරව්කරුවන්.

05. විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

06.ලොතරැයි ටිකට් නියෝජිතවරුන්.

07.පුද්ගලික බස්රථ නියෝජිතවරුන්.

08.කුලී රථ අයිතිකරුවන්.

09.රැකියා ඒජන්තවරුන්.

10.කොමිස් ඒජන්තවරුන්.

11.ප්‍රචාරක නියෝජතවරුන්.

12.මෝටර් රථ වාහන අලෙවිකරුවන්.

13.මැණික් වෙළෙන්දන්.

14.බැංකු හෝ රක්ෂණ නියෝජිතවරුන්.

15.ඉන්ධන පිරවුම්හල් නියෝජිතවරුන්.

16.සැපයුම්කරුවන් (හුණුගල්, කළු ගල්).

17.උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.

18.අනෙකුත් ව්‍යාපාරික නියෝජිතවරුන්.

19. තාවකාලික අලෙවි ප්‍රවර්ධන කටයුතු.

20.ක්‍රීඩා සමාජ පවත්වාගෙන යාම.

21.රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම.

22.පෞද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම.

23.පෞද්ගලික තැපැල්හලක් පවත්වාගෙන යාම.

24.මත්පැන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම. (අවසර ලත්)

25.පරිගණක පුහුණු කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

26.ගිණුම් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.

27.සන්නිවේදන සේවා සපයන ආයතනවල නියෝජිතවරුන්.

28.මෙම වගන්තිය යටතේ ව්‍යාපාර බදු ගෙවිය යුතු බවට බුත්තල ප්‍රාදේශිය සභාව විසින් නියම කරනු ලබන ඇතැම් සීමිත සමාගම්.

29. යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබා දීම.

30. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

31. සම්ප්‍රේෂණ කුළුණු.

32. යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරන හඳුන්කූරු අලෙවිකරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

33. රසායනාගාරයක් පවත්වාගෙන යාම.

34. විශ්‍රාම ශාලා පවත්වාගෙන යාම.

35. කාමර පහසුකම් ලබා දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (කාමර 03ක් සඳහා රු.1200.00 කාමර 03 ට වැඩි රු. 3000.00)

36. වැලි , ගඩොල් ගබඩා කිරිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

37.ගෘහ නිර්මාණ හා උද්‍යාන ශිල්පී ආයතනයක් පවත්වාගෙන යාම.

38. පෞද්ගලික අධ්‍යාපන ආයතනයත පවත්වාගෙන යාමේ ව්‍යාපාරයක්.

39. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.

40. ලී බඩු වෙඳසැලක් පවත්වාගෙන යාම.

41.ගෘහ භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

42. සාප්පු බඩු වෙළඳ සැලක් පවත්වාගෙන යාම.

43. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.

44. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

45 පිඟන් බඩු විකිණිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

46. ධාන්‍ය මිලදී ගැනිම හා විකිණිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

47. මහන මැෂින් අමතර කොටස් විකිණිමේ ව්‍යාපරයක් පවත්වාගෙන යාම.

48. විදුලි උපකරණ විකිණිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

49. පරිගණක උපාංග විකිණිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

50. වාහන අමතර කොටස් විකිණිමේ ව්‍යාපරයක් පවත්වාගෙන යාම.

51. යතුරු පැදි හා පාපැදි විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

52. මසා නිමකල ඇඳුම් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

53. පත්තර, සඟරා, පාසල් උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

54. බුලත් පුවක් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

55. සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

56. තැඹිලි හා කුරුම්බා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

57. ඉංග්‍රිසි බෙහෙත් අලෙවි කිරීමේ  ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.(ෆාමසි)

58. විසිතුරු මැටි බඳුන් අලෙවි කිරීමේ  ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

59. ශබ්ද විකාශන යන්ත්‍ර හා උත්සව භාණ්ඩ කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

60. දුරකථන ඇමතුම් සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (කොමියුනිකේෂන්)

61. අඟුරු සඳහා දැව පොල්කටු දැමීම හෝ අගුරු ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

62. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කිරීම හා ටයර් ටියුබ් අලෙවිය.

63.කොට්ට පුළුන් කපු පුළුන් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

64. ශරිර සුවතා ආයතනයක් පවත්වාගෙන යාම

65.  බෝල මේස ක්‍රිඩා කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

66. නොතාරිස් කාර්යාලයක්  පවත්වාගෙන යාම

67. පොල් ලී අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම

68. ජෝතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම

69. පාවහන් විකිණීමේ හා ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

70. ගුවන්විදුලි, රූපවාහිනි යන්ත්‍ර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

71. ගුවන් විදුලි ,රූපවාහනි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

72. සිගරැට් තොග වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම

73. ලොතරැයි ටිකට්පත් විකණීමේ  ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

74. දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම

75. වෙළඳ ප්‍රචාරක දැන්වීම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

76. ටයර් ටියුබ් අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

77. දැව විකුණන ව්‍යාපාරික ස්ථානයක්  පවත්වාගෙන යාම.

78. ගීත පටිගත කරන ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම.

79. මනාලියන් හැඩගැන්වීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම.

80. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම

81. පිත්තල භාණ්ඩ විකිණීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම

82. ගෙවතු පිරිසිදු කිරීම/ අලංකරණය කිරීමේ සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

83. කොන්ක්‍රීට් පෙරසැරි භාණ්ඩ අලෙවිය හා නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

84. උත්සව භාණ්ඩ කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

85. කොන්ක්‍රීට් මිශ්‍රණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

86.විසිතුරු මසුන් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

87.සමාජ ශාලාවක් පවත්වාගෙන යාම (කාර්ය මණ්ඩල සමාජ ශාලාවක්)

88. පෞද්ගලික රථගාල් පවත්වාගෙන යාම.

89.එක් දින වෙන්දේසියක් පවත්වාගෙන යාම

1.ඉඩම්

2.රත්තරන්

90.සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම (පොල් තෙල් හා භූමි තෙල් සහිතව)

**බුත්තල ප්‍රාදේශිය සභාව**
**<u>ප්‍රචාරක දැන්වීම් දැශ්‍යා පරිසරය</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122(1) වගන්තියෙන් බුත්තල ප්‍රාදේශිය සභාව වෙත පැවරි ඇති බලතල අනුව 1988.08.23 දින අංක 520/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළාත් පාලනය භාර ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ජේදය යටතේ වූ ප්‍රචාරක දැන්වීම් (බැනර් ආදිය)ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් 2025.01.01වැනි දින සිට පනවා අය කළ යුතු බව 2024.09.26 දින පැවැති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

**උප ලේඛනය**

| විස්තරය | රු.ශත |
|---|---|
| 01. ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා<br>බිත්තියක් හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන විට<br>වර්ග අඩියකට හෝ ඉන් කොටසක් සඳහා | |
| එක් කාර්තුවක් සඳහා | රු. 50.00 |
| කාර්තු 2 ක් සඳහා | රු. 65.00 |
| කාර්තු 3 ක් සඳහා | රු. 75.00 |
| 02. තාවකාලික ප්‍රචාරක දැන්වීමක් සඳහා බැනරයක් වශයෙන්<br>ප්‍රදර්ශනය කරනු ලබන විට වර්ග අඩියකට හෝ ඉන් කොටසකට<br>මසකට, (වර්ග අඩියකට) | රු.75.00 |
| 03. චිත්‍රපටි පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් හෝ වෙනත් ප්‍රචාරක<br>බැනරයක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට<br>මසකට(වර්ග අඩියකට) | රු 75.00 |
| 04.LED නාම පුවරු වර්ග අඩි එකක් සඳහා මාස 3කට | රු. 250.00 |
| මාස 6කට | රු. 500.00 |
| වසරකට | රු. 700.00 |

**බුත්තල ප්‍රාදේශීය සභාව**

**2024 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනු ප්‍රමාණයන් අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ 2025.01.01 දින සිට නියම කර අයකිරීමට තීරණය කළ බව එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙන අතර,එකී පනතේ 148(3) වැනි වගන්තිය ප්‍රකාර මෙම මුදල 2025 මාර්තු මස 31 දිනට පෙර ගෙවිය යුතු බවට 2024.09.26 දින පැවැති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශීය සභාව.

උප ලේඛනය

| | |
|---|---|
| | රු.ශත |
| 01 .මෝටර් රථයක්,මෝටර් ට්‍රයි කාර්යක්,මෝටර් බයිසිකලයක්,කරත්තයක්, මෝටර් ලොරියක්,ජින් රික්ෂෝවක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු 25.00 |
| 02. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර්යක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ)වෙළඳ කාර්යන් සඳහා යොදවන්නේ නම් | රු18.00 |
| (ආ)වෙළඳ කාර්යන් නොවන කාර්යන් සඳහා යොදවන්නේ නම්, | |
| නියමිත බලපත්‍ර ගාස්තුව | රු 4.00 |
| ලිපි ද්‍රව්‍ය ගාස්තු | රු 21.00 |
| 03 සෑම කරත්තයක් සඳහා | රු 10.00 |
| 04 සෑම අත්කරත්තයක් සඳහා | රු.20.00 |
| 05 සෑම රික්ෂෝවක් සඳහා | රු10.00 |
| 06 සෑම අශ්වයකු,පෝනියකු, කොටළුවකු සඳහා | රු 7.50 |
| 07 සෑම අලියෙකු සහ ඇතකු සඳහා | රු.50.00 |

**බුත්තල ප්‍රාදේශීය සභාව**

**ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2025 වර්ෂය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සීයයට එකක(1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරව්කරු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුගාමිකයන් විසින් 2025.01.01 දින සිට බුත්තල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 2024.09.26 බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශීය සභාව

**බුත්තල ප්‍රාදේශීය සභාව**

**<u>ප්‍රසිද්ධ රඟ දැක්වීමේදී ආඥා පනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ, 9(3) වගන්තිය යටතේ විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන සියලුම වේදිකා නාට්‍ය,චිත්‍රපට දර්ශන ,සංගීත සංදර්ශන,සරකස් සංදර්ශන හා වෙනත් සංදර්ශන සඳහා බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වන මුදල් අයකර සංදර්ශනය කර, එසේ අයකරන මුදලින් 10% බැගින් වූ ප්‍රතිශතයක් වශයෙන් විනෝද බද්දක් පනවා අයකර යුතු බව, 2024.09.26 වැනි දින බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

**බුත්තල ප්‍රාදේශීය සභාව**

**වරිපනම් බද්ද- 2025 වර්ෂය**

බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති කොටසේ පිහිටියා වූ ද,වැල්ලවාය පාර,මොනරාගල පාර,කතරගම පාර,බඩල්කුඹුර පාර (පස්සර පාර) ඔක්කම්පිටිය පාර,යන ප්‍රධාන මාර්ග දෙපස පිහිටියා වූ නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් 12% ක් ද,අනෙකුත් අතුරු මාර්ග වලින් 10% ක් ද, බැගින් වූ වරිපනම් බද්දක් 2025 වර්ෂය සඳහා 2025 මාර්තු මස 31,ජුනි මස 30,සැප්තැම්බර් මස 30,දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන අයුරින් කාර්තු 4 කින් ගෙවා අවසන් කළ යුතු පරිදි පනවා අය කිරීමටත්, මෙයට පෙර අය කළ තක්සේරුව පිළිගන්නා බවත්, 2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු,2025 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශිය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක(10%) වට්ටමක් ලබා දීම සහ කාර්තු වශයෙන් වරිපනම් ගාස්තු එම කාර්තුවේ මුල් මාසය ඇතුළත ගෙවීම් කරන්නේ නම් 5% ක වට්ටමක් ගෙවීම සුදුසු බවටත් 2024.09.26 බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

**<u>බුත්තල ප්‍රාදේශීය සභාව</u>**

**<u>අක්කර බද්ද - 2025 වර්ෂය</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 134(3) වැනි වගන්තියෙන් සැලසී ඇති විධිවිධාන පරිදි බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය නොකරනු ලබන ප්‍රදේශවල පිහිටියා වූ ස්ථිර,නිතිපතා ගොවිතැන් යටතේ වූ ඉඩම් වලින් පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් අක්කර බද්දක් 2025.01.01 දින සිට පනවා අය කිරිමට තිරණය කර ඇති බව 2024.09.26 බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින

බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

- වරිපනම් නම් සංශෝධන ඉල්ලුම්පත්‍ර ගාස්තුව රු250.00
- වරිපනම් නම් සංශෝධනය සඳහා රු 2000.00 අය කල යුතුය.

උප ලේඛනය

| ඉඩම් ප්‍රමාණය | බදු අනු ප්‍රමාණය වර්ෂයකට රු.ශත |
|---|---|
| 01. ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 5 කට අඩු හෙක්ටයාර් 1 ට නොඅඩු වන අවස්ථාවක දී එක් හෙක්ටයාරයකට | රු 50.00 |
| 02. ඉඩමේ ප්‍රමාණ හෙක්ටයාර් 5 ක් හෝ ඊට වැඩි වන අවස්ථාව දී එක් හෙක්ටයාරයකට | රු 10.00 |

**<u>බුත්තල ප්‍රාදේශීය සභාව</u>**

**<u>රථ ගාල් ගාස්තු අය කිරීම.</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(ඌ) උපවගන්තියට අනුව අතුරු ව්‍යවස්ථාවට අනුකූලව බුත්තල ප්‍රාදේශීය සභාව විසින් ස්ථාපිත කර ඇති බුත්තල ප්‍රාදේශිය සභා බලප්‍රදේශයේ නගර වල ඇති ත්‍රීවීල්,ට්‍රැක්ටර් රථ,වෑන් රථ,ලොරි රථ,සහ අත්ට්‍රැක්ටර් රථ සඳහා සකස් කර ඇති වාහන ගාල් කිරීම නවතා තැබීම,පාලනය කිරීම සඳහා 2025.01.01 දින සිට පහත උප ලේඛනයට අනුව ගාස්තු අය කිරීමට 2024.09.26 බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටු නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින

බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේ දීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

**උප ලේඛනය**

**<u>මෝටර් රථ වාහන වර්ගය</u>**

01. ත්‍රීවීල් රථ
02. කාර් හා වෑන්
03. කුඩා හා ලොකු ලොරි
04. ටේලර් සහිත හෝ රහිත ට්‍රැක්ටර්
05. බස් රථ
06. මෝටර් සයිකල්(යතුරු පැදි)
07. මෝටර් රථ
08. කැබ් රථ හා ජීප් රථ
09. ටිපර් රථ

**අංක 02 උපලේඛනය**

**<u>පොදු වාහන නතර කර තැබීමේ ස්ථානවල නතර කර තබන වාහන ගාස්තු</u>**

| | පළමු පැය හෝ ඉන් කොටසක් සඳහා | සෑම අතිරේක පැයක් සඳහා හෝ ඉන් කොටසක් සඳහා හා එහෙත් පැය 04 කට නොවැඩි | අතිරේක සෑම පැයක් සඳහා හෝ ඉන් කොටසක් එහෙත් පැය 04කට වැඩි |
|---|---|---|---|

| | රු .ශත | රු. ශත | රු. ශත |
|---|---|---|---|
| 01.යතුරු පැදියක් සඳහා | රු.20.00 | රු.20.00 | රු.10.00 |
| 02. ත්‍රීරෝද රථයක් සඳහා | රු.30.00 | රු.20.00 | රු.10.00 |
| 03.මෝටර් කාර් හෝ මෝටර් රථ | රු.50.00 | රු.30.00 | රු.20.00 |
| 04.බස් රථයක් හෝ ලොරි රථ | රු.150.00 | රු.100.00 | රු.50.00 |
| 05.වෙනත් මෝටර් වාහන සඳහා | රු.100.00 | රු.50.00 | රු.30.00 |

**අංක 03 උපලේඛනය**

**<u>මාසික අවසර පත්‍ර ගාස්තු</u>**

| | |
|---|---|
| 01. ත්‍රීරෝද රථයක් සඳහා | රු.100.00 |
| 02.මෝටර් කාර්/කැබ් රථ/ජීප් රථ/ලොරි රථ/වෑන් රථ | රු.200.00 |
| 03.බස් රථයක් සඳහා | රු.300.00 |
| 04.ලොරි රථයක් සඳහා | රු.200.00 |
| 05. ට්‍රැක්ටර් ට්‍රේලරය සමඟ | රු.200.00 |
| 06.වෙනත් මෝටර් වාහනයක | රු.200.00 |
| 07.අත් ට්‍රැක්ටර් සඳහා | රු.150.00 |

**අංක 04 උපලේඛනය**

| **වාහන වර්ගය** | **මසකට අය කරන ගාස්තුව රු. ශත** |
|---|---|
| ත්‍රීවීල් රථ | 150.00 |
| වෑන් රථ | 250.00 |
| ලොරි රථ | 300.00 |
| ට්‍රැක්ටර් රථ | 300.00 |
| අත් ට්‍රැක්ටර් රථ | 150.00 |

**<u>දෛනික ජංගම වෙළදාම සඳහා ගාස්තු අය කිරීම.</u>**

| වෙළදාම | යතුරු පැදි | ත්‍රීවීල් | අනෙකුත් වාහන |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| ජංගම මාළු වෙළදාම. | 150.00 | 150.00 | 250.00 |
| ජංගම පළතුරු වෙළදාම | 150.00 | 150.00 | 250.00 |
| ජංගම රස කැවිලි හා බේකරි නිෂ්පාදන | 150.00 | 150.00 | 250.00 |
| ජංගම එළවළු වෙළදාම හා වෙනත් | 150.00 | 150.00 | 250.00 |

**<u>ජංගම වෙළදාම සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම</u>**

| අනු අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750 ට නොවැඩි රු.ශත | වාර්ෂිකවටිනාකම රු.751 සිට1500 දක්වා රු.ශත | වාර්ෂික වටිනාකම රු.1501 ට වැඩි රු.ශත |
|---|---|---|---|---|
| 01 | අයිස්ක්‍රීම් වෙළඳාම(ජංගම රථ මගින්) | 500.00 | 750.00 | 1000.00 |
| 02 | මාළු වෙළඳාම ( ජංගම රථ මගින්) | 500.00 | 750.00 | 1000.00 |
| 03 | රස කැවිලි හා බේකරි නිෂ්පාදන (ජංගම රථ මගින්) | 500.00 | 500.00 | 1000.00 |
| 04 | එළවළු වෙළඳාම (ජංගම රථ මගින්) | 500.00 | 750.00 | 1000.00 |
| 05 | වෙනත් ජංගම වෙළඳාම (ජංගම රථ මගින්) | 500.00 | 750.00 | 1000.00 |

**<u>සභාව සතු පහත සඳහන් ද්‍රව්‍ය ලබාදීමට අදාල මිල ගණන් දැක්වීම</u>**

1.ගැල්වනයිස් කොඩි කණු 01 ක් සඳහා දිනකට රු.120.00 බැගින් අයකරනු ලැබේ.
2.ප්ලාස්ටික් පුටු 01 ක් සඳහා දිනකට රු.20.00 බැගින් අයකරනු ලැබේ.

මෙම ද්‍රව්‍ය නිවැරදිව භාර නොදුන්නහොත් ඒ සඳහා නැවත මිලදී ගැනිමට වැයවන මුළු මුදල රැගෙන යනු ලබන පුද්ගලයාගෙන් අයකර ගැනිමටද කටයුතු කරනු ලැබේ.

**<u>බුත්තල ප්‍රාදේශීය සභාව.</u>**

**<u>පාරිසරික බලපත්‍ර ගාස්තු පැනවීම - 2025 වර්ෂය</u>**

1988 අංක 56 දරණ ජාතික පාරිසරික පනතින් සංශෝධිත, 1980 අංක 47 දරණ පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරි ඇති බලතල ප්‍රකාරව, බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන යම් කර්මාන්තයක් , ව්‍යාපාරයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු යම් තැනැත්තෙකුගෙන් පහත උප ලේඛනයේ සඳහන් පරිදි පරික්ෂණ ගාස්තුවක් හා බලපත්‍ර ගාස්තුවක් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බවටත්, එකී ගාස්තුව බලපත්‍රය ලබා ගැනිමට පෙර බුත්තල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් 2024.09.26 බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදිය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

උප ලේඛනය

1. පරික්ෂණ ගාස්තු - රු. 3,000.00 ක අවමයක සිට රු.10,000.00 ක් දක්වා උපරිමයකට යටත් වේ.(කර්මාන්තයේ වර්ගය හා ප්‍රමාණය අනුව ගාස්තුව වෙනස් විය හැකිය.)

2. බලපත්‍ර ගාස්තුව රු. 4,500.00 කි.

**බුත්තල ප්‍රාදේශීය සභාව.**

**සහතික පත් හෝ සේවාවක් ලබාදීම සඳහා ගාස්තු අය කිරීම - 2025 වර්ෂය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභා වලට පැවරි ඇති බලතල ප්‍රකාරව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උප ලේඛනය පළවන (1) තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබා දීම සඳහා එම උප ලේඛනයේ ( II) වන තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බවටත් එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනිමට පෙර එම ගාස්තුව බුත්තල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 2024.09.26 බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

උප ලේඛනය

| (1) වැනි තීරුවේ | II වන තීරුවේ ගාස්තු ප්‍රමාණය රු. ශත |
|---|---|
| 1. ඉඩම් සැලැසුම් අනුමත කිරීමේ ගාස්තු | |
| 2. අනුකූලතා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තුව | නාගරික සංවර්ධන අධිකාරියේ අංක 2235 /54 හා 2021.07.08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර ප්‍රකාරව |
| 3. ගොඩනැගැලි අයදුම්පත්‍ර ගාස්තුව | රු. 500.00 |
| 4. ඉඩම් අනු කොටස් වලට බෙදීමේ අයදුම්පත්‍ර ගාස්තුව | රු. 300.00 |
| 5.ගොඩනැගිලි අයදුම්පත්‍රවල කාලය දීර්ඝ කිරිම සඳහා ගාස්තුව | රු. 1000.00 |
| 6. පෙරසැරි ගාස්තු | නාගරික සංවර්ධන අධිකාරියේ අංක 2235 /54 හා 2021.07.08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව |
| 7. ඉඩම් කට්ටි සැලැසුම් අනුමත කිරීම (පර්චස් එකක් සඳහා) | රු.500.00 හා නාගරික සංවර්ධන අධිකාරියේ අංක 2235 /54 හා 2021.07.08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව |

8. අනුමත ගොඩනැගිලි සැලසුම් සහතික කළ පිටපතක් ලබා ගැනීම සඳහා රු.1000.00

9. විථි රේඛා හා නොපරවා ගැනීමේ සහතිකය ලබා ගැනීම සඳහා රු 1000.00

**බුත්තල ප්‍රාදේශීය සභාව.**

**පුස්තකාල හා කියවීම් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම .**

**2025 වර්ෂය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122/1 වගන්ති ප්‍රකාරව සකස් කොට අංක 3014 දරණ හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ගැසට් පත්‍රයේ Iv (ආ) කොටසේ පළකරන ලද පුස්තකාල හා කියවීම් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බවට 2024.09.26 බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

උප ලේඛනය

| I තීරුව | II තීරුව රු. ශත. |
|---|---|
| ➢ දඩ ගාස්තු | 5.00 |
| ➢ අලුත් කිරීමේ ගාස්තු | 100.00 |
| ➢ වැඩිහිටි සාමාජික ගාස්තු | 160.00 |
| ➢ ළමා සාමාජික ගාස්තු | 100.00 |

**බුත්තල මහජන පුස්තකාලයේ පවතින විද්‍යුත් පුස්තකාල සඳහා අය කිරීම්**

- විද්‍යුත් පුස්තකාල සඳහා රු 500 ක සමාජික ගාස්තු අය කිරීම.
- අන්තර්ජාල පහසුකම් සඳහා මිනිත්තු 15කට රු 10 ක් අයකරන අතර පැයක් සඳහා රු 40 මුදලක් අයකර ගැනීමටත් පිටපත් ලබා ගැනිමේදි වර්ණ පිටපත් 1ක් සඳහා රු 50ක්ද කළු සුදු පිටපත් 1ක් සඳහා රු 20ක් ගාස්තු ලබා ගැනීම.

**බුත්තල ප්‍රාදේශීය සභාව.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122/1 වගන්ති ප්‍රකාරව සකස් කොට අංක 3014 දරණ හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළ කරන ලද ජල ගාස්තු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බවට 2024.09.26 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

**2025 වර්ෂයට මාළිගාවිල / ජනාවාස 09/11 ජල ව්‍යාපෘති දෙක සඳහා ජල ගාස්තු අයකිරීම.**

01) ගෘහස්ථ කාර්යන් සඳහා ජල ගාස්තු අයකිරීම පහත පරිදි වේ.

| ඒකක | ඒකකයකට අය කිරීම |
|---|---|
| 1-10 | 30.00 |
| 11-20 | 40.00 |
| 21-25 | 55.00 |
| 26-30 | 65.00 |
| 30 ට වැඩි සෑම ඒකකයකටම | 70.00 |

- ❖ වාණිජ කාර්යන් සඳහා ඒකකයකට රු.80.00 බැගින් අය කරනු ලැබේ.
- ❖ ගෘහස්ථ කාර්යන් සඳහා රු.200.00 ක් හා හා වාණිජ කාර්යන් සඳහා රු.300.00 ස්ථාවර ගාස්තු වශයෙන් අය කරනු ලැබේ.
- ❖ ඒකක 20 ට වඩා වැඩියෙන් ජලය පාරිභෝජනය කරන්නේ නම්, 10% ක අධි ගාස්තුවක් අය කරනු ලැබේ.

02) නව ජල සම්බන්ධතා ලබා දීමේදී ඉල්ලුම්පත්‍ර ගාස්තු සඳහා රු. 500.00 ක් අය කරනු ලැබේ.

03) මාළිගාවිල ජල ව්‍යාපෘතිය සහ ජනාවාස 9/11 ජල ව්‍යාපෘතිය සඳහා රු 25000.00 ක් සේවා ගාස්තු වශයෙන් ද ලිපි ද්‍රව්‍ය ගාස්තු ලෙස රු 500.00 ක්ද අය කෙරේ. එමෙන්ම ගෘහස්ථ තැන්පතු ගාස්තු වශයෙන් රු 7500.00 ක්ද වාණිජ කටයුතු සඳහා තැන්පතු වශයෙන් 15,000.00 ක් ද අය කරන අතර නිවැරදිව හිභයකින් තොරව ජල මනුව නැවත සභාවට භාර දීමෙන් පසු එම තැන්පතු ගාස්තු අදාළ පාරිභෝගිකයා වෙත ගෙවනු ලැබේ.

04)

- ❖ මනුවලට අනිසි ලෙස අත ගැසීම මනු වල මුද්‍රා කැඩීම හා අයථා පරිදි ජලය ලබා ගැනීම සඳහා ගෘහ අය කිරීම සහ වෙළඳ හා කාර්යාල අය කිරීම රු 15,000.00කි. බිල්පත් මාසිකව නොගෙවීම හේතුවෙන් විසන්ධි කිරීමෙන් අනතුරුව දින 14 ඇතුලත ජල සම්බන්ධතාව ලබා ගන්නේ නම් රු 5000.00 ක් ද දින 14 පසුව ජල සම්බන්ධතාව ගන්නේ නම් රු 7500.00ක් ද යලි ඇමුණුම් ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.
- ❖ ජල මනුව හා නිවාස අතර ජලනල මාර්ගය අළුත් වැඩියා කිරීමට සිදු වුවහොත් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයිය යුතු අතර , ශ්‍රම කුලිය ගෙවිය යුතුය.
- ❖ නියමිත මාසයේ ජල ගාස්තුව ජල බිල්පත නිකුත් කිරීමේ දිනයේ සිට දින 15 ඇතුලත දී බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයට හෝ බලයලත් නිළධාරියාට නොගෙවුවහොත් එම ජල සම්බන්ධතාව බුත්තල ප්‍රාදේශීය සභාව සතු කරගත යුතුවාත් මෙන්ම බුත්තල ප්‍රාදේශීය සභාව විසින් ඔබගේ ජල සැපයුම විසන්ධි කරනු ලැබේ.
- ❖ 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනත ) 34 අතුරු ව්‍යවස්ථාව යටතේ හිඟ ජල ගාස්තු අයකර ගැනීම සඳහා නිතීමය පියවර ගනු ලැබේ.
- ❖ ගිවිසුම් අවලංගු කිරීම පූර්වෝක්ත දෙපාර්ශවයෙන් එක් පාර්ශවයක අභිප්‍රාය වුවහොත් එසේ තීරණය කළ පාර්ශවය තමන්ගේ එකී අභිප්‍රාය අනෙක් පාර්ශවය වෙත දින 30ට ප්‍රථමයෙන් දැනුම් දී එසේ කළ යුතුය. එසේ ගිවිසුම් අවලංගු කිරීමෙන් පසුව නැවතත් අලුත් ගිවිසුමකට ඇතුලත් නොවී අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ නැවත ජල සේවාව පාවිච්චි කිරිමට කිසිදු අයිතිවාසිකමක් බලයක් නොමැත.
- ❖ කලින් කලට වෙනස්වන ජල ගාස්තු හා අංක 02,03 හි සඳහන් ගාස්තු ගෙවිය යුතුය.
- ❖ පදිංචි වෙනස් වීමට හේතු වුවහොත් කවර හෝ අවස්ථාවකදී ඒ බව අයිතිකරු හෝ පදිංචිකරු විසින් යථා පරිදි බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිළධාරියාට දැනුම් දීම කළ යුතුය.
- ❖ නාම සංශෝධනයේදී රු.3000.00 ක මුදලක් අය කිරීම් කළ යුතුය.

06) ජල බවුසර් සේවාව

- ❖ හිස් ට්‍රැක්ටර් බවුසරය ( ලීටර් 3,000) දිනකට සැපයීම රු .1250.00
- ❖ හිස් ලොරි බවුසරය ( ලීටර් 6,000) දිනකට රු .6,000.00 (යාමට සහ ඒමට කි.මී 5 ක් ඇතුලත)
- ❖ කි.මී 5 ට වැඩිවන සෑම කි. මීටරයකටම රු.250.00 බැගින් , යාමට හා ඒමට

සභාව සතු යන්ත්‍රෝපකරණ සැපයීම වෙනුවෙන් ගාස්තු අයකිරීම. රු. ශත

- ❖ මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර සැපයීම මීටර් පැය 01 සඳහා ගමන් කාලය ඇතුළුව - රු 12,000.00
- ❖ මාර්ග තලන යන්ත්‍රය සැපයීම මීටර් පැයක් සඳහා ගමන් කාලය ඇතුළුව
  - ටොන් 8 - රු 8,000.00
  - ටොන් 14 - රු 10,000.00
- ❖ බැකෝ ලෝඩර් යන්ත්‍රය සැපයීම මීටර් පැය 1 ක් සඳහා ගමන් කාලය ඇතුළුව - රු 7000.00
- ❖ ටිපර් රථ සැපයීම සඳහා ගාස්තු කියුබ් 03 මීටර් පැය 01 ක් සඳහා - රු. 4000.00
- ❖ ටිපර් රථ සැපයීම සඳහා ගාස්තු කියුබ් 02 මීටර් පැය 01 සඳහා - රු 3000.00

**බුත්තල ප්‍රාදේශීය සභාව.**

**කසල ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යටතේ ගාස්තු අය කිරීම - 2025 වර්ෂය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරණ හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළ කරන ලද කසළ ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බව 2024.09.26 පැවති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශීය සභාව

**අය කරනු ලබන කසල ගාස්තු ප්‍රමාණය**

උප ලේඛනය

| අ.අ | සේවා/ද්‍රව්‍ය/ස්ථාන/කර්මාන්ත | මාසික මුදල (රු) |
|---|---|---|
| 01 | ආපන ශාලා | රු. 200.00 |
| 02 | බේකරි | රු.250.00 |
| 03 | එළවළු හා පළතුරු කඩ | රු.300.00 |
| 04 | මාළු හා මස් කඩ (කුකුළු/එළු/ගව /ඌරු) | රු.250.00 |
| 05 | සේවා සැපයුම් ස්ථාන | රු.200.00 |
| 06 | ව්‍යාපාරික ස්ථාන (සාමාන්‍ය ප්‍රමාණයේ කසල ජනනය වන) | රු.200.00 |
| 07 | කර්මාන්ත ශාලා | රු.1000.00 |
| 08 | හෝටල් කාමර 1 - 5 | රු.200.00 |
| | කාමර 6 -10 | රු.250.00 |
| | කාමර 11 - 15 | රු.300.00 |
| | කාමර 15 -20 | රු.350.00 |
| | කාමර 21 ට වැඩි | රු.500.00 |

- ගෘහස්ථ ඒකක හා නිවස වලින් , පාසල්,පෙර පාසල්,ආගමික ස්ථාන වලින් කසල බදු අය නොකෙරේ.

යම් නිවසක හෝ ආයතනයක අපද්‍රව්‍ය බැහැරලීම සඳහා තක්සේරු ගාස්තු ගෙවා බැහැර වීමට සභාව සතු වාහන යෙදවීම ආදායම් පරීක්ෂකවරුන්ගේ තක්සේරු වාරතාව අනුව ගාස්තු අය කර සේවා සැපයීම.

**බුත්තල ප්‍රාදේශීය සභාව.**
**නිශ්චල දේපළ කළමනාකරණය පිළිබඳ වූ සම්මන්ත්‍රණශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාවයටතේ ගාස්තු අය කිරීම - 2025 වර්ෂය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරණ හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදි ජනජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ නිශ්චල දේපළ කළමනාකරණය පිළිබඳ වූ සම්මන්ත්‍රණශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බව 2024.09.26 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

උප ලේඛනය

| 1 තීරුවේ | II වන තීරුව |
|---|---|
| | රු. ශත |
| ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලා වෙන් කිරීම - එක් දිනකට | 4000.00 |
| ගොවිපියස ශාලාව- රාජ්‍ය ආයතන හා පෙර පාසල් සඳහා දිනකට | 5,000.00 |
| ගොවිපයස ශාලාව-මුදල් අය කරන පෞද්ගලික කටයුතු සඳහා දිනකට | 8,000.00 |
| බුත්තල නව පොළ භූමිය (ශාලා අංක 01) පැරණි | රු 10,000.00 |
| (ශාලා අංක 02) නව | |
| පැල්වත්ත පොළ භූමිය | රු 5000.00 |
| ඔක්කම්පිටිය පොළ භූමිය | රු 5000.00 |
| ගෝනගංආර නව පොළ භූමිය | රු 3000.00 |
| (ජල ගාස්තු හා විදුලි ගාස්තු හැර) | |

**1 වැනි උපලේඛනය**

ප්‍රාදේශීය සභාවේ පිහිටි .............................................................................................. සම්මන්ත්‍රණ ශාලාව
පරිහරණය සඳහා අවසර ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය

01. ඉල්ලුම්කරු/ආයතනයේනම :
..........................................................................................................................
02. ලිපිනය :
..........................................................................................................................
03. ජා.හැ.අංකය :
..........................................................................................................................
04. රැස්වීම් ශාලාව ඉල්ලුම් කරනු ලබන කාරණය :
05. අවශ්‍ය කරන දිනය හා වේලාව :

දින සිට දින තෙක් වේලාව

................... .................. ..................

06. ශාලාව භාවිත කිරීමට පිටතින් රැගෙන එන උපකරණ ලී බඩු හා ශබ්දවාහිනී උපකරණ විස්තර

..............................................................................................................................................

..............................................................................................................

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීම් අනුව අදාළ රැස්වීම් ශාලාව වෙන් කර දෙනු ලැබුවහොත්, එම රැස්වීම් ශාලාවේ ගොඩනැගිලිවලට ඉදිකිරීම් වලට උපකරණවලට හා සවිකිරීම් වලට කිසියම් හානියක් සිදු වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් ප්‍රාදේශීය සභාව විසින් අය කර ගැනීමට එකඟ වන අතර, එහි තැන්පත් මුදල අය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන විටක තවදුරටත් අවශ්‍ය වන මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවීමට එකඟ වෙමි. එසේම සම්මන්ත්‍රණ ශාලාව අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන පිළිපැදීමට එකඟ වෙමි.

දිනය : ..................................... අත්සන : ....................................

**<u>බුත්තල ප්‍රාදේශීය සභාව.</u>**

**<u>දඩාවතේ යන සතුන් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම 2025වර්ෂය</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරණ හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පල කරන ලද දඩාවතේ යන සතුන් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බව 2024.09.26 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශීය සභාව

උප ලේඛනය

| 1 තීරුව | II වන තීරුව |
|---|---|
| | රු. ශත |
| අයාලේ යන ගවයින් ඇල්ලීම | 1,000.00 |
| ගාල් කර රැක බලා ගැනීම - එක් දිනකට | 500.00 බැගින් |
| රජයේ ගාස්තුව | 2,000.00 |

**බුත්තල ප්‍රාදේශීය සභාව.**

**මාර්ගවල ගමන් කරන වාහන වල බර හා වේගය සීමා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම - 2025 වර්ෂය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරණ හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ මාර්ගවල ගමන් කරන වාහන වල බර හා වේගය සීමා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බව 2024.09.26 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශිය සභා කාර්යාලයේදීය.

සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශිය සභාව.

උප ලේඛනය

**ප්‍රාදේශිය සභා මාරග වල ගමනා ගමනය සඳහා අයදුම්පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ නම : ......................................................................................
02. ලිපිනය : ......................................................................................
03. ජා.හැ.අංකය : ......................................................................................
04. දුරකතන අංකය : ......................................................................................
05. වාහන අංකය : ......................................................................................
06. වාහනයේ බර : ......................................................................................
07. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍ය : ......................................................................................
08. ද්‍රව්‍ය පැටවූ පසු සම්පූර්ණ බර : ......................................................................................
09. ගමන් කරන මාර්ගය පිළිබඳ විස්තර: ......................................................................................

රූප සටහන් මගින්

10. අයදුම්කරන අවසර පත්‍රය වලංගු විය යුතු කාල සීමාව

ආරම්භක දිනය : .......................................  අවසාන දිනය : .............................

11. ප්‍රාදේශිය සභා මාර්ග වල ගමනා ගමනය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් සියල්ලම පිළිපදින බවටත්, අවසර පත්‍රය මගින් ලැබී ඇති අවසරය පරිදි ක්‍රියා කරන බවටත් මෙයින් පොරොන්දු වෙමි.

අයදුම්කරුගේ අත්සන : ..................................

දිනය : .......................................

**2 වන උපලේඛනය**

**නියමිත බර සීමාව ඉක්මවා වාහන ධාවනය කිරීමේ අවසර පත්‍රය**

01. සභාවේ නම : ..........................................................................................
02. බලපත්‍රධාරියාගේ නම : ..........................................................................................
03. බලපත්‍රධාරියාගේ ලිපිනය : ..........................................................................................
04. වාහනයේ අංකය : ..........................................................................................
05. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍ය : ..........................................................................................
06. උපරිම මුළු බර ප්‍රමාණය : ..........................................................................................
07. අවසර පත්‍ර වලංගු කාල සීමාව : ..........................................................................................

| දිනය | ආරම්භක වේලාව | අවසාන වේලාව |
|---|---|---|
| 01. ................... | .............................. | ............................. |
| 02. ................... | .............................. | ............................. |
| 03. ................... | .............................. | ............................. |
| 04. ................... | .............................. | ............................. |
| 05. ................... | .............................. | ............................. |

අවසර පත්‍රයේ වලංගු මාර්ගයන් :

01. ..........................................................................................................
02. ..........................................................................................................
03. ..........................................................................................................
04. ..........................................................................................................
05. ..........................................................................................................

................................
සභාපති/සභා ලේකම්

.......................
(ප්‍රාදේශිය සභාව)
නිල මුද්‍රාව

දිනය : ...................................

තුන්වෙනි උපලේඛනය

.................................................. ප්‍රාදේශිය සභාව

| | මාර්ගයේ නම | දුර ප්‍රමාණය | උපරිම බර සීමාව | උපරිම වේග සීමාව |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |

උපලේඛනය

| 1 තීරුව | II වන තීරුව | වේග සීමාව | බර |
|---|---|---|---|
| ගංගා වැලි ප්‍රවාහනය කියුබ් 01 | රු. 200.00 | පැයට කි.මී.30 | ටොන්5ටඅඩු බොරළු |
| ප්‍රවාහනය කියුබ් 01 | රු. 200.00 | පැයට කි.මී.30 | ටොන්7ටඅඩු වෙනත් ඛනිජ |
| සම්පත් | රු. 200.00 | පැයට කි.මී.30 | ටොන් 5ට අඩු |
| දැව ප්‍රවාහනය ලොරි රථයකින් | රු. 500.00 | පැයට කි.මී.30 | ටොන් 10ට අඩු |
| දැව ප්‍රවාහනය ට්‍රැක්ටරයකින් | රු. 250.00 | පැයට කි.මී.25 | ටොන් 5ට අඩු |

**බුත්තල ප්‍රාදේශීය සභාව.**
**මළ අපද්‍රව්‍ය ප්‍රවාහනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම -**
**2025 වර්ෂය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරණ හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළ කරන ලද මලාප්‍රවාහනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2025.01.01 දින සිට පනවා අය කළ යුතු බව 2024.09.26 වැනි දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සභා ලේකම් ,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

උප ලේඛනය

| 1 වන තීරුව | II වන තීරුව<br>රු. ශත |
|---|---|
| ගලි රථ සේවය කාර්යාලයේ සිට වරිපනම් සීමාව තුළ සේවා සැපයීම | 9000.00 |
| ගමන් කරන එක් කි.මී.සඳහා යැමට සහ ඒමට පිළිබඳ | 250.00 |
| වරිපනම් සිමාවෙන් පිටත එක් ගලි රථයක් සඳහා | 13,000.00 |
| කාර්යාල පරිශ්‍රයේ සිට වරිපනම් නගර සීමාවෙන් පිට සෑම කි.මී සඳහා | 250.00 |
| සේවා ගාස්තු(වරිපනම් සීමාව තුළ) | 1000.00 |
| සේවා ගාස්තු(වරිපනම් සීමාවෙන් පිට) | 1500.00 |

**කඩ කාමර පැවරීමේ ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධවයි**

01.කඩ කාමර පැවරීමේදී ලේ ඥාතීන් (කලත්‍රයා, දූ දරුවන්)අතර සිදුවේ නම් ලිපි ද්‍රව්‍ය හා සේවා ගාස්තු ලෙස රු 15,000.00 ක මුදලක් අයකිරිමටත්,

02.ඥාති නොවන පාර්ශවයන් අතර ඒකි කඩ කාමර පැවරීම් කටයුතු කරන්නේ නම් පැවරුම් ගාස්තු රු100,000.00ක මුදලක් අයකරගෙන අදාළ පැවරීම් කටයුතු කිරීමටත් සුදුසු බවට කමිටුව මඟින් නිර්දේශ කරන ලදී.

**බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම -**
**2025 වර්ෂය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ VIII වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල අනුව බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2019 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක කොට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද දියුණු කලා යැයි හඳුනා ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 442/17 දරණ හා 1987.02.27 වැනි දින හා ගැසට් පත්‍ර අංක 455/21 දරණ හා 1987.05.28 වැනි දින හා ගැසට් පත්‍ර වලින් ප්‍රකාශයට පත් කරන ලද බිම් කොටස් හැර ඉතිරි සෑම භූමි ප්‍රමාණයක් සඳහාම මෙකී අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කොට ගෙඩනැගිලි ඉදි කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම හා ගාස්තු අය කිරීම 2025.01.01 වන දින සිට ක්‍රියාත්මක කළ යුතු බව 2024.09.26 ප්‍රාදේශීය සභා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මා තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

............................
සභා ලේකම්,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 26 වන දින
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

**බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම් පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 VIII වගන්තිය යටතේ බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන අදාළ වන බල ප්‍රදේශයන්හි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් හා ගොඩනැගිලි ඉදි කිරීමට අදාළ ඉඩම් කොටස් සඳහා වන සැලසුම් පරීක්ෂා කිරීම සහ ඒ සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස පනවනු ලබයි.

03. මෙම අතුරු ව්‍යවස්ථාව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ගොඩනැගිලි ඉදිකිරීම සහ ඉඩම් කොටස් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

04. බුත්තල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ යම් ඉඩමක පොළොව අභ්‍යන්තරයට හෝ පොළොව මතුපිටට ඉදි කරනු ලබන සෑම ස්ථිර ඉඩමක්ම හා ඉදි කිරීමකට අදාළ වන සෑම ඉඩම් කොටසක්ම නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව සභාපති විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල විය යුතුයි.

05. බුත්තල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සැලසුම් හා ඉඩම් කොටසකට හෝ ඉඩම් අනු බෙදුමකට අදාල සැලසුමක් අනුමත කර ගැනීම සඳහා 1953 අංක 53 දරණ සංශෝධිත පනතේ සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුව සකස් කරන ලද අයදුම්පතක් යටතේ අයදුම් කළ යුතු අතර, බුත්තල ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සම්මත කරනු ලබන ගාස්තුවක් ගෙවා බුත්තල ප්‍රාදේශීය සභාව වෙතින් අදාළ අයදුම්පත ලබා ගත යුතුය.

06. 1953 අංක 53 දරණ සංශෝධිත පනතින් සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥා පනතට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මක් සඳහා වූ සෑම අයදුම්පත්‍රක්ම එම ආඥා පනත යටතේ අනුමත කරන ලද ඉඩම් කොටස් සඳහාම විය යුතුය.

07. ඉහත 06 වන වගන්තිය අනුව ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයකටම අදාළ වූ සැලසුම් බුත්තල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලද සංයුතියකින් යුතු කමිටුවක් විසින් පරීක්ෂා කර බැලිය යුතුය.

08. 07 වන වගන්තියෙහි සඳහන් කාර්යන් සඳහා සභාව විසින් කලින් කලට යෝජනා සම්මුතියන් මඟින් තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම නීත්‍යානුකූල වන්නේය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් කොටසක් හෝ අනුබෙදුමක් සඳහා වන සැලසුම් පරීක්ෂා කිරීම,අදාල සැලැස්ම අනුමත කිරීම නිවාස හා නගර සංවර්ධන ආඥා පනත හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

10. අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සැලසුම් අයදුම්පත්‍රයක්ම සම්බන්ධයෙන්ම බුත්තල ප්‍රාදේශීය සභාව වෙත ලැබී දින 30ක් ඇතුලත ඊට අදාළ අනුමැතිය හෝ එය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට අදාළ හේතු සහිතව තීරණය අයදුම්කරු වෙත ලිඛිතව දැන්විය යුතුයි.

11. ඉහත 07 වන වගන්තියෙහි කමිටුවෙහි කාරයය සඳහා ඊට අදාළ සංයුතියෙහි සාමාජිකයින් වෙනුවෙන් අතිරේක පරිශ්‍රමිකයක් සභාව විසින් තීරණය කරන ලදුව අදාළ පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ගෙවීම නීත්‍යානුකූල වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ 05 වන වගන්තිය යටතේ ඉදිරිපත් වන අයදුම්පත, ඉදිකිරීම සඳහා අදාළ ඉඩම් කොටස් අනුමත කර ගැනීම සඳහා වන අයදුම්පත්‍රයක් වන විටදී අනුබෙදුමට අදාළ වන සම්පූරණ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 01ක් හෝ ඊට වඩා වැඩි වන විටදී හා එම ඉඩම්, ඉඩම් කොටස් අටක් (08) හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයකට අනුබෙදුම් වන විටදී, අනුබෙදුමට අදාල මාර්ග සඳහා වෙන් කර ඇති ප්‍රමාණය හැර ඉතිරි ප්‍රමාණයන් අදාළ ඉඩමේ පොදු පහසුකම් වශයෙන් බුත්තල ප්‍රාදේශීය සභාව වෙත තෑගි කර හිමි කර දිය යුතු ය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මඟින් ඒ වරදට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීමෙන් හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියෙහි (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිම විය යුතුය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස :

සභාව යන්නෙන් බුත්තල ප්‍රාදේශීය සභාව ද ,

සභාපති යන්නෙන් බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති ද ,

තැනැත්තා යන්නෙන් යම් පුද්ගලයෙකු හෝ සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක්ද අදහස් වේ.

**බුත්තල ප්‍රාදේශිය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සැලසුම් පරික්ෂා කිරීම සහ අය කිරීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

V වැනි උපලේඛනය

සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු :( රෙගුලාසි 1,3,5,28,30,44,73,82,83,85,91,96,105)

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | පෙරසැරි ගාස්තු (බදු රහිත) | |
|---|---|---|
| 01.ඉඩම් අනුබෙදුම් කිරීම | I ව.මී.150-500 අතර<br>Ii ව.මී. 501 - 1000 අතර<br>Iii ව.මී. 1001 - 5000 අතර<br>Iv ව.මී. 5001 – 10,000 අතර | රු 2,000.00<br>රු 3,000.00<br>රු 7,500.00<br>රු 10,000.00 |
| | V.ව.මී 10,000 වැඩි | රු 10,000 (+,-) ව.මී 10,000 ට වැඩි සෑම ව.මී 1000 කටම හෝ ඉන් කොටසකටම රු 1000.00 බැගින්. |
| 02.කුඹුරු ඉඩම් සහ පහත් බිම් ගොඩ කිරීම | I ව.මී 250 දක්වා | රු 2500.00 |
| | II ව.මී 250 ට වැඩි | රු 2500 (+,-) ව.මී. 250ට වැඩි සෑම ව.මී 100 කටම හෝ ඉන් කොටසකටම රු 2500 බැගින්. |
| 3.I මායිම් තාප්ප/ රුඳවුම් බැම් ඉදිකිරීම් | දික් මීටර් 01 කට | රු 100.00 |
| 03.IIඅත්තිවාරමක් සහිත මායිම් වෙන් කිරීම් | දික් මීටර් 01 කට | රු 50.00 |
| 04.සන්නිවේදන කුළුණු / ඇන්ටනා කුළුණු /සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම | රු 30,000.00 | |
| 05.ඉන්ධන පිරවුම්හල් / සේවා ස්ථාන | i දුම් පරීක්ෂා කරන ස්ථාන | රු 25,000.00 |
| | ii ඉන්ධන පිරවුම්හල් | රු 75,000.00 |
| | iii වාහන සේවා ස්ථාන | රු 50,000.00 |
| | iv.වාහන සේවා ස්ථාන හා දුම් පරීක්ෂාව | රු 75,000.00 |
| | v.ඉන්ධන පිරවුම්හල් හා ඒ සම්බන්ධ වෙනත් භාවිතයන් | රු 150,000.00 |
| 06.දැන්වීම් පුවරු | i.ඩිජිටල් දැන්වීම් පුවරු ( ව.මි. 01 කට) | රු ,5000.00 |
| | ii ඩිජිටල් නොවන දැන්වීම් පුවරු ( ව.මි. 01 කට) | රු. 3000.00 |
| | Iii නාම පුවරු ( ව.මි. 01 කට) | රු 1000.00 |
| | Iv මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (ව.මි. 01 කට) | රු 6000.00 |
| 07.කසල රුස් කිරීමේ අංගන /බැහැර කරන ස්ථාන / කොම්පෝස්ට් අංගන / සෞඛ්‍ය ආරක්ෂිතව කසල යොදා ඉඩම් ගොඩකිරීම හා අදාල වෙනත් සංවර්ධන කටයුතු. | I භූමි ප්‍රමාණය වර්ග මීටර 4000 දක්වා | රු 50,000.00 |
| | II භූමි ප්‍රමාණය වර්ග මීටර 4000 ට වඩා වැඩි | රු 50,000.00 වැඩිවන සෑම වර්ග මී 4000 ටම හෝ ඉන් කොටසකටම රු 10,000.00 බැගින් |
| 08.ජලය ආශ්‍රිත ගොඩනැඟිලි සහ ජලය ආශ්‍රිත සංවර්ධනයන් | | රු 50,000.00 |
| 09.වාණිජ පරමාර්ථයෙන් කරනු ලබන කළුගල් කැඩීම , ගල් කුඩු | | රු 10,000.00 |

| | | |
|---|---|---|
| කිරීමේ අංගන,පස් කැපීම,පස් සෝදා වැලි ගැනීම, ගොඩ වැලි කැනීම, මැටි හා බොරළු කැණීම | | |
| 10.ඛණිජ සම්පත් කැණීම් සඳහා කරනු ලබන පරීක්ෂණ | I .වර්ග කිලෝමීටර් 01ක් දක්වා | රු 100,000.00 |
| | ii. වර්ග කිලෝමීටර් 01ට වැඩි | රු 100,000/ වැඩිවන වරග කිලෝමීටර 01 ට වැඩිවන සෑම වර්ග කිලෝමීටර් 01ට හෝ ඉන් කොටසකටම රු 10,000.00 බැගින් |
| ii. ඉහත අංක 10 (I) ට අමතරව සිදුකරන වෙනත් ඛණිජ සම්පත් කැනීම් | I .වර්ග කිලෝමීටර් 01ක් දක්වා | රු 100,000.00 |
| | ii. වර්ග කිලෝමීටර් 01ට වඩා වැඩි | රු 100,000.00 වැඩිවන වර්ග කිලෝමීටර් 01 වැඩිවන සෑම වර්ග කිලෝමීටර් 01 ට හෝ ඉන් කොටසකටම රු 10,000 බැගින් |
| | | |
| 11.ළමා නිවාස / වැඩිහිටි නිවාස / පුනරුත්ථාපන මධ්‍යස්ථාන | **ඉඩමේ ප්‍රමාණය** | **ගාස්තුව** |
| | I.ව.මී 400 දක්වා | රු 2500.00 |
| | II.ව.මී 401 – ව.මී 500 දක්වා | රු 5,000.00 |
| | III ව.මී 401 – ව.මී 750 දක්වා | රු 10,000.00 |
| | IV. ව.මී 751 – ව.මී 1000 දක්වා | රු 20,000.00 |
| | V. ව.මී 1000 ට වැඩි | රු 20,000.00 වැඩි වර්ග මීටර් 1000 වැඩිවන සෑම ව.මී 100ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු 500.00 බැගින් |
| 12. ඉහත 1 සිට 11 දක්වා සඳහන් නොවන වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා | **ගෙබිම් ප්‍රමාණය** | **ගාස්තුව** |
| | Iව.මී 400 දක්වා | රු 5000.00 |
| | II.ව.මී 401 – ව.මී 500 දක්වා | රු 10,000.00 |
| | III ව.මී 401 – ව.මී 750 දක්වා | රු 25,000.00 |
| | IV. ව.මී 751 – ව.මී 1000 දක්වා | රු 50,000.00 |
| | V. ව.මී 1000 ට වැඩි | රු 50,000 වැඩි ව.මී 1000 වැඩි වන සෑම ව.මී 100 ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු 500 බැගින් |
| 13. ගෙබිම් ප්‍රමාණය වෙනස් නොවී අනුමත සැලැස්මේ සිදු කරනු ලබන අභ්‍යන්තර වෙනස් කිරීම් | වර්ග මීටර් 1000ක් දක්වා<br>වර්ග මීටර් 1000 ට වැඩි | රු 5000.00<br>රු 10,000.00 |
| 14.රථවාහන ඇගයීම් වාර්තාව සඳහා වන නිරවුල් සහතිකය | රු 60,000.00 | |
| 15. පාරිසරික ඇගයිම් වාර්තාව සඳහා වන නිරවුල් සහතිකය | ECC - රු 50,000.00 | EIA - රු 150,000.00 |
| 16.මුලික සැලසුම් නිරාකරණය අළුත් කිරීම | I. වසරක වලංගු කාලය ඉක්මවීමට පෙර අයදුම් කරන්නේ නම් - මුලික සැලසුම් නිරාකරණ සහතිකය සඳහා ගෙවූ මුදලින් 25% ක මුදලක්.<br>II. වසරක වලංගු කාලය ඉක්මවා ගොස් වසරක් තුළ අයදුම් කරන්නේ නම් - මුලික සැලසුම් නිරාකරණය සහතිකය සඳහා ගෙවූ මුදලින් 50% ක මුදලක්.<br>III. වසරක වලංගු කාලය ඉක්මවීමෙන් පසු අයදුම් කරන්නේ නම්- මුලික සැලසුම් නිරාකරණය සඳහා වන සම්පූරණ ගාස්තුව | |

| | |
|---|---|
| 17.මුලික සැලසුම් නිරාකරණ සහතිකයේ සහතික කරන ලද පිටපත් සඳහා | රු 10,000.00 |
| 18.මුලික සැලසුම් නිරාකරණය වෙනත් පාර්ශවයකට පැවරීම | රු 25,000.00 |
| 19.කඩිනම් සේවය - ( සියළුම අවශ්‍යතා හා අදාළ අනෙකුත් ලේඛන සම්පුරණ කරන ලද දින සිට වැඩ කරන ලද දින 07 ක් තුළ) | සාමාන්‍ය ගාස්තුව මෙන් හතර ගුණයක් අය කළ යුතු වේ. |
| 20.පරිපාලන වියදම් | රු 5000.00 |
| 21.ආගමික කටයුතු හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිවලට අදාළ ගාස්තු | රු 5000 ක් පරිපාලන ගාස්තුවකට යටත්ව |

<table>
<tr><th colspan="5">සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහා වන පෙරසැරි ගාස්තු</th></tr>
<tr><th>සංවර්ධන කාර්යයේ ස්වභාවය</th><th colspan="4">අයකළ යුතු ගාස්තු</th></tr>
<tr><td>1.ඉඩම් අනුබෙදුම් ස්වභාවය</td><td colspan="2">ඉඩමේ ප්‍රමාණය<br>ව.මී</td><td colspan="2">පෙරසැරි ගාස්තු</td></tr>
<tr><td rowspan="4"></td><td colspan="2">ව.මී 150 - ව.මී 300</td><td colspan="2">කැබලි 1 ක් සඳහා රු 1000.00</td></tr>
<tr><td colspan="2">ව.මී 301 - ව.මී 600</td><td colspan="2">කැබලි 1 ක් සඳහා රු 800.00</td></tr>
<tr><td colspan="2">ව.මී 601 - ව.මී 900</td><td colspan="2">කැබලි 1 ක් සඳහා රු 600.00</td></tr>
<tr><td colspan="2">ව.මී 900 ට වැඩි</td><td colspan="2">කැබලි 1ක් සඳහා රු 500.00</td></tr>
<tr><td>2.මායිම් තාප්ප/ රැඳවුම් බැම් ඉදිකිරීම</td><td colspan="2">දික් මීටර් 1ක් සඳහා</td><td colspan="2">රු 100.00</td></tr>
<tr><td>3.සන්නිවේදන කුළුණු / ඇන්ටනා /කුළුණු / සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම</td><td colspan="4">රු 40,000.00</td></tr>
<tr><td>4.ඉන්ධන පිරවුම්හල් / වාහන සේවා ස්ථාන / දුම් පරීක්ෂා කරන ස්ථාන</td><td colspan="2">ව.මී 1කට</td><td colspan="2">රු 100.00</td></tr>
<tr><td rowspan="4">5.දැන්වීම් පුවරු</td><td colspan="2">I .ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී 1 කට)</td><td colspan="2">රු 2500.00</td></tr>
<tr><td colspan="2">II. ඩිජිටල් නොවන දැන්වීම් පුවරු ( ව.මී 1 කට)</td><td colspan="2">රු 1500.00</td></tr>
<tr><td colspan="2">III. නාම පුවරු (ව.මී කට)</td><td colspan="2">රු 500.00</td></tr>
<tr><td colspan="2">Iv.මාර්ගය ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (ව.මී 1කට)</td><td colspan="2">රු 1000.00</td></tr>
<tr><td rowspan="2">6. කසල බැහැර කිරීමේ අංගන / තාවකාලිකව රැස්කර තබන ස්ථාන /කොම්පෝස්ට් අංගන / සෞඛ්‍යාරක්ෂිත කසල යොදා ඉඩම් ගොඩකරීම.</td><td colspan="2">හෙක් 1 දක්වා</td><td colspan="2">රු 25,000.00</td></tr>
<tr><td colspan="2">හෙක් 1 ට වැඩි</td><td colspan="2">රු 25,000.00 වැඩිවන සෑම හෙක් 1කට හෝ ඉන් කොටසක් සඳහා රු 5000.00 බැගින්</td></tr>
<tr><td rowspan="5">7. නේවාසික හා නේවාසික නොවන ගොඩනැඟිලි</td><td rowspan="2">ගෙබිම ප්‍රමාණය (ව.මී)</td><td>නේවාසික (ව.මීටර් 1කට)</td><td>(ව.මීටර් 1කට)</td><td rowspan="2">නේවාසික නොවන (ව.මීටර් 1කට)</td></tr>
<tr><td>තනි පුද්ගල</td><td>මහල් නිවාස</td></tr>
<tr><td>ව.මී 400 දක්වා</td><td>රු 20.00</td><td>රු 25.00</td><td>රු 25.00</td></tr>
<tr><td>ව.මී 401 දක්වා 1000</td><td>රු 22.00</td><td>රු 27.00</td><td>රු 27.00</td></tr>
<tr><td>ව.මී 1001</td><td>රු 25.00</td><td>රු30.00</td><td>රු30.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | දක්වා 1500 | | | |
| | ව.මී 1501 දක්වා 2000 | රු 25.00 | රු32.00 | රු32.00 |
| | ව.මී 2000ට වැඩි | වැඩිවන සෑම ව.මී 90 ක් සඳහාම රු 2000 බැගින් | වැඩිවන සෑම ව.මී 90 ක් සඳහාම රු 2000 බැගින් | වැඩිවන සෑම ව.මී 90 ක් සඳහාම 2000 ක් බැගින් |
| 8. වාණිජ පරමාර්තයෙන් සිදු කරනු ලබන I.පිහිනුම් තටාකය (තටාකයේ ඩෙක් සමඟ ) හෝ II. සූර්ය පැනල සඳහා වන ගාස්තු | **වර්ග ප්‍රමාණය (ව.මී)** | | **ගාස්තුව (රු)** | |
| | ව.මී 300 දක්වා | | රු 6000.00 | |
| | ව.මී 301 – 500 | | රු 15000.00 | |
| | ව.මී 501 – 1000 | | රු 30,000.00 | |
| | ව.මී 1000 ට වැඩි | | රු 30,000 වැඩිවන සෑම ව.මී 100 හෝ ඉන් කොටසක් සඳහා රු 1000 බැගින් | |
| 9. I. අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩිවන සේ සිදු කරන වෙනස් කිරීම් හා එකතු කිරීම | මුළු පෙරසැරි ගාස්තුවෙන් 25% වැඩි වන අමතර වරග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව. | | | |
| II. ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත සැලැස්ම තුළ සිදු කරනු වෙනස් කිරීම් | මුල් අනුමැතියේදී ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25% | | | |
| 10. සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශවයකට පැරීම | රු 25,000.00 | | | |
| 11.සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම. | I<br>. ව.මී 1000 දක්වා | | රු 5000 | |
| | II. ව.මී 1000 ට වැඩි | | රු 10000 | |

**හරිත ගොඩනැඟිලි සහතිකය සඳහා ගාස්තු**

| **සංවර්ධන කාර්යයේ ස්භාවය** | **පෙරසැරි ගාස්තුව (බදු රහිත) රුපියල්** |
|---|---|
| 1. සියලුම බාණ්ඩ සඳහා හරිත ගොඩනැඟිලි (සහතිකය සඳහා ලියාපදිංචි වීම) | රු 5000 |
| 2. අවසාන හරිත ගොඩනැඟිලි සහතිකය ලබාගැනීම (උපරිම පෙරසැරි ගාස්තුව මිලියන 1) | **වර්ග මීටරයකට ගාස්තුව*** |
| I.සහතික මට්ටම | රු 600 |
| II.රිදී මට්ටම | රු 500 |
| III.රන් මට්ටම | රු 400 |
| Iv ප්ලැටිනම් මට්ටම | රු 300 |
| ➢ අවසාන හරිත ගොඩනැඟිලි සහතිකය සඳහා වන අයදුම්පත භාරදෙනු | |

| | |
|---|---|
| ලබන අවස්ථාවේදි 75%ක මූලික ගෙවීමක් සිදු කල යුතුය. | |
| 3. රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතන ආයතන ,ආගමික ස්ථාන රජයේ සෞඛ්‍ය ආයතන සහ වැඩිහිටි සහ ළමා නිවාස | ව.මී ට රු50.00 |
| බලපත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී ඉල්ලුම් කර ඇති හරිත මට්ටම් හා අනුකූලතා සහතිකය නිකුත් කරන අවස්ථාවේදී ලගා කර ගෙන ඇති හරිත මට්ටමේහි යම් වෙනසක් පවතීනම්, ලභා කර ගෙන ඇති මට්ටම අනුව ගෙවිය යුතු පෙරසැරි ගාස්තුවෙහි වෙනස ප්‍රතිපූරණය කොට අනුකූලතා සහතිකය ලබා ගත යුතුය. | |

| **පසුවිපරම් හා නිරීක්ෂණ වාරතාව සඳහා ගාස්තු** | | |
|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරිම | ව.මි 900 - ව.මි 2000 | රු 3000.00 |
| | ව.මි 2001 - ව.මි 5000 | රු 5000.00 |
| | ව.මි 5000 වැඩි | රු10,000.00 |

| **ආවරණ අනුමැතිය ලබාදීම සඳහා වන සේවා ගාස්තු ( පෙරසැරි ගාස්තු වලට අමතරව)** | | |
|---|---|---|
| **සංවර්ධනයේ ස්භාවය** | **අයකළ යුතු ගාස්තු ( බදු රහිත)** | |
| 1.අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරන ලද | ඉඩම් කැබලි 1ක් සඳහා රු 3000 බැගින් | |
| 2.අනුමැතියකින් තොරව ගොඩනැඟිලි ඉදිකිරිම් / එකතු කිරීම් / නැවත ඉදිකිරීම් | **නේවාසික** (ව.මී 1කට) | නේවාසික නොවන (ව.මී 1කට) |
| I.අත්තිවාරම් වැඩ පමණක් සම්පුරණ කර ඇති විට (කයිරු මට්ටම් දක්වා) | රු 200 | රු 500 |
| II.වහල මට්ටම් දක්වා ඉදිකිරීම් ටැම් සහ බාල්ක ඇතු එව ඉදිකර ඇති විට (වහලය හැර) | රු 300 | රු 1000 |
| III වහලය සහිත බිත්ති ඉදිකිරීම් | රු 400 | රු 1500 |
| IVපදිංචි වීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් | රු 500 | රු 2000 |
| 3.අනුකූලතා සහතිකය ( CoC) ,නොගෙන පදිංචි වීම. | දිනකට රු 100 | |
| 4.වාහන නැවැත්වීමේ ස්ථාන (පරිශ්‍රය තුළ ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු)<br>I.සියලුම මහ නගර සභා | සම්මත වාහන නැවැත්වීම - රු 500,000<br>ලොරි රථ - රු 1,000,000<br>කන්ටේනර් ඇතුළු බහු ඇක්සල් වාහනය- රු 2,500,000 | |
| IIනගර සභා | සියලුම වාහන සඳහා රු 500,000 | |
| IIIප්‍රාදේශීය සභා | සියලුම වාහන සඳහා රු 250,000 | |
| 5.රථවාහන නැවැත්වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිතා කිරීම | එක ඉඩකඩක් සඳහා රුපියල් 20,000 ක් සහ අනුමත සැලැස්ම පරිදි වාහන නැවැත්වීමට පරිවර්තනය වන තෙක් වසරකට 10% ක වර්ධකයක් සහිතව. | |

| **අනුකූලතා සහතිකය නිකුත් කිරීම සඳහා ගාස්තු** | | | | |
|---|---|---|---|---|
| **සංවර්ධන කාර්යයේ ස්වභාවය** | **අයකළ යුතු ගාස්තු (බදු රහිත)** | | | |
| 1.ඉඩම් අනු බෙදුම් කිරීම | එක් කැබැල්ලකට රු 1000 | | | |
| 2.ගොඩනැඟිලි ඉදිකිරීම | **ගෙබිම් ප්‍රමාණය (ව.මී)** | **නේවාසික** | | **නේවාසික නොවන** |
| | | **තනි පුද්ගල** | **මහල් නිවාස** | |
| | ව.මී 400 දක්වා | රු 4000 | රු 5000 | රු 5000 |
| | ව.මී 400 ට | රු 4000 + ව.මී | රු 5000 + ව.මී | රු 5000 + ව.මී |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩි | 400 ට වැඩිවන සෑම ව.මී 1ට හෝ ඉන් කොටසක් සඳහා රු 15 බැගින් | 400 ට වැඩිවන සෑම ව.මී 1ට හෝ ඉන් කොටසක් සඳහා රු 20 බැගින් | 400 ට වැඩිවන සෑම ව.මී 1ට හෝ ඉන් කොටසක් සඳහා රු 25 බැගින් |
| 3.සන්නිවේදන කුළුණු . ඇන්ටනා කළුණු/ සම්ප්‍රේෂණ කළුණු සඳහා | රු 5000 | | | |
| 4.මායිම් තාප්ප හා රැඳවුම් බැම් | දික් මීටර් 1කට රු 25 බැගින් | | | |
| 5.පොදුගොඩනැඟිලි සඳහා වන අනුකූලතා සහතිකය අත් කිරීම | රු 10000 | | | |
| **භාවිතයන් වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු** | | | | |
| පෙරසැරි ගාස්තු | ගෙබිම් ප්‍රමාණය (ව.මී) | | ගාස්තුව (රුපියල්) (බදු රහිත) | |
| | 45 දක්වා | | 1000 | |
| | 45-90 | | 1500 | |
| | 91-180 | | 1750 | |
| | 181-270 | | 2000 | |
| | 271-450 | | 2500 | |
| | 451-675 | | 2750 | |
| | 676-900 | | 3000 | |
| | 900 වැඩි | | වර්ග මීටර් 900 ට වැඩිවන සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු 500 බැගින් | |
| **අවසර පත්‍රය සඳහා ගාස්තු** | | | | |
| I නේවාසික භාවිතයන් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනිම. | වර්ග මීටරයක් සඳහා රු 750 | | | |
| Ii නේවාසික නොවන අනිකුත් භාවිතයන් වෙනත් භාවිතයන් සඳහා යොදා ගැනීම | වර්ග මීටරයක් සඳහා රු 500 | | | |